**කොළඹ මහා නගර සභාව.**

**කොළඹ දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 31 දින නගරාධිපතිනියට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වටිනාකම රු.1,640,047,138 ක් ලෙස සඳහන් වුවත් බැංකු සනාථ කිරීම් අනුව එය රු.1,640,904,857 ක් විය. මේ අනුව රු.857,719 කින් ආයෝජන වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ මුදල රු.2,742,988,306 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,498,238,432 ක් ලෙස දැක්වීම නිසා වැටුප් ප්‍රතිපූර්ණ රු.244,749,874 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.9,546,085 ක් විවිධ ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි.

**(ඈ)** රථ වාහන ගාල් කිරීම කළමනාකරණය සඳහා පෞද්ගලික ආයතනයකින් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ මුදල වන රු.5,754,683 ක් විවිධ ණයගැතියන් යටතේ ඇතුලත් කර නොතිබූ බැවින් එම වටිනාකමින් ණයගැතියන් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඉ)** 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය තුල ඇති දේපළ 7960 කට අදාලව එකතුව රු.214,076,367 ක් වූ බැර ශේෂය ගිණුම්වල වෙනම හෙළිදරව් කිරීම වෙනුවට හිඟ වරිපනම් (හර) ශේෂයන්ට ගැලපීම හේතුවෙන් සත්‍ය ශේෂයන් ගිණුම් වලින් පිළිබිඹු නොවීය.

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

ගිණුම් විෂයයන් 49 ට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් හා ඊට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,029,825,262 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එකී වෙනස්කම් වලට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**

(i) වර්ෂ 17 කට පෙර සිට පැවත එන රු.26,112,325 ක්වූ ලැබිය යුතු ගිණුම් 24 ක ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ii)** වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නිලධාරීන්වෙත ලබා දී ඇති සුළු මුදල් හා විශේෂ අත්තිකාරම් ගිණුම්වල නිරවුල් නොවූ රු.3,183,108 ක ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(iii)** සභාවට ලැබිය යුතු ණයගැති ශේෂ තුළ අක්‍රීය ගිණුම් 3298 කට අදාලව රු.395,801,868 ක වටිනාකමක් විය.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

**(i)** වසර 17 කට පමණ පෙර සිට පැවත එන ගෙවිය යුතු තැන්පත් රු.99,848,922 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ii)** දේශිය ආදායම් බදු පනත යටතේ එකතු කරන ලද රු.19,722,493 ක බදු මුදල් දේශිය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.16,275,106,238 ක් වූ ගිණුම් විෂයයන් 55 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/සංනිරික්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| **(අ) මහා නගර සභා ආඥා පනත** | | |
| **i. 218 වගන්තිය** | - | මුදල් වර්ෂය තුලදි පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් නොකෙරුණි. |
| **ii. 247 (ආ) වගන්තිය** | - | වෙළඳ බදු වලට අදාල ව්‍යාපාර හඳුනාගෙන ඒවාට බදු පැනවීම හා බදු ගෙවීම පැහැර හරින්නට විරුද්ධව පියවර ගැනීමට සභාව ක්‍රියාකර නොතිබුන නිසා සභාවට සැලකිය |

| | | | |
|---|---|---|---|
| | | | යුතු ආදායමක් අහිමි වී තිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX වන පරිච්ඡේදය** | - | නිවාස වර්ගීකරණය කර ඒ අනුව පොරොත්තු ලේඛනයට, ඉල්ලුම්කරුවන්ගේ නම් ඇතුලත් කර එම අනුපිළිවෙල අනුව නිවාස වෙන්කර දීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| **(i)** | **මු.රෙ. 371 (6)** | 3,183,108 | සුළු මුදල් අග්‍රිම අදාල මුදල් වර්ෂය තුලදීම පියවීමට කටයුතු කර නොතිබුණි. |
| **(ii)** | **මු.රෙ. 395 (ඇ)** | - | බැංකු ගිණුම් 06 කට අදාල බැංකු සැසඳුම් පිළියෙල කිරීම මාස 03 සිට මාස 18 දක්වා ප්‍රමාද වූ අවස්ථා පැවතුනි. |
| **(iii)** | **මු. රෙ.396 (ඇ)** | 20,667,004 | නිකුත් කල ගෙවීම සඳහා ඉදිරිපත් නොකල මාස 06 කට වැඩි කාලයක් ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| **(iv)** | **මු.රෙ 715 (2) (ඉ)** | - | කැම්බල් පාර්ක්හි මාර්ග සළකුණු අංශයේ තාක්ෂණික නිළධාරියා වෙත ලැබෙන හා නිකුත් |

| | | | |
|---|---|---|---|
| | | | කරන තොග ලේඛනයක සටහන් කර නොතිබීම . |
| **(v)** | **මු.රෙ. 762** | 3,685,125 | අවශ්‍ය ප්‍රමාණයට තොග පවත්වා ගැනීමටත් පමණට වඩා අධික තොග තබා නොගැනීමටත් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වුවද මාර්ග සංඥා අංශයේ ගබඩාවක සහ සුදුවැල්ල ගබඩාවක කල් ඉකුත් වූ තර්මෝප්ලාස්ටික් තොගයක් ගොඩ ගසා තිබුණි. |
| **(vi)** | **මු.රෙ.1653** | **-** | දිසා කාර්යාල 03 ක ඇති වාහන 32 ක මයිලෝ මීටරය ක්‍රියාවිරහිතව ඇති අතර ඒවා අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | **1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | | ස්ථාවර වත්කම් ගිණුම් තැබීමේදී විධිමත් ක්‍රමවේදයක් සභාව විසින් අනුගමනය කර නොතිබුණි. සභාව විසින් ඉදිරිපත් කර තිබූ පරිසනක වාර්තාවට (CD) අනුව වත්කම් මිලදීගත් ආයතනය හා මිලදීගත් වර්ෂය පිළිබඳ හඳුනාගත හැකි ක්‍රමවේදයක් අන්තර්ගත කර නොතිබුණි. |
| (ඉ) | **1987 සැප්තැම්බර් 20 දිනැති අංක 08 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය** | 733,098,863 | නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ මුදල් වලින් හඳුනාගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| 666,397,877 | නාගරික සංවර්ධන අධිකාරි විශේෂ බැංකු ගිණුමේ හා ඊට අදාල වගකීම් ගිණුම වන රාජ්‍ය නියෝජිත ගිණුමේ ශේෂ දෙක අතර රු.666,397,877 ක වෙනසක් පැවතුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,382,289,817 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,042,313,090 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

(අ) ජංගම ගිණුම් 03 කට අදාල රු. 26,143,590 ක්වූ ඍජු බැර කිරීම් හා සාවද්‍ය බැර කිරීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජංගම ගිණුම් 02 ක තැන්පත් කරන ලද වර්ෂ 01 සිට 03 ක කාලයක් ඉක්මවා තිබූ රු. 238,605,706 ක් වූ උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. වරිපනම් හා බදු | **4,184,150,000** | **3,617,947,176** | **3,296,218,745** | **2,866,777,928** | **3,866,930,000** | **3,248,676,453** | **3,188,725,003** | **2,626,877,427** |
| ii.කුලී | **312,249,000** | **209,246,261** | **188,877,437** | **840,333,827** | **305,670,000** | **176,208,721** | **141,6000,243** | **674,957,155** |
| iii.බල පත්‍ර ගාස්තු | **82,730,000** | **-** | **77,683,663** | **-** | **90,787,000** | **-** | **84,636,479** | **-** |
| iv.වෙනත් ආදායම් | **2,018,234,000** | **-** | **3,212,916,987** | **-** | **2,100,330,000** | **-** | **5,043,175,533** | **-** |

**2.3.2 වරිපනම් හා බදු**

**(අ) වරිපනම්**

(i) 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් රු.2,829,783,399 ක් වූ අතර එයින් රු.500,000 ඉක්ම වූ දේපළ 718 කට අදාළ හිඟ වරිපනම් වටිනාකම රු.1,413,867,572 ක් විය. එය මුළු හිඟයෙන් සියයට 50 ක ප්‍රතිශතයකි.

(ii) මහා නගර සභා ආඥා පනතේ 230 (4) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන හා නිවාස අමාත්‍යවරයා විසින් නිකුත් කල 1988 පෙබරවාරි 19 දිනැති අංක 494 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව වරිපනම් බදු ගෙවනු ලබන්නන් වෙත සියයට 10 සහ සියයට 5 ක වට්ටම් ලබා ගැනීමට හිමිකමක් පවතින නමුත් පසුගිය වර්ෂ සඳහා ගෙවිය යුතු හිඟ ශේෂ එසේම තිබියදී ප්‍රවර්තන වර්ෂයට අදාල ගෙවීම් පමණක් සිදුකළ පුද්ගලයින් හා ආයතන සඳහාද වට්ටම් ලබා දී තිබුණි. නියැදි පරීක්ෂාවේදි ගැසට් නිවේදනයට පටහැනිව දේපළ 116 ක් වෙනුවෙන් රු.5,717,841 ක වටිනාකමක් වට්ටම් ලෙස ලබා දී තිබුණි. නියමිත පරිදි වරිපනම් ගෙවන්නන් හා නොගෙවන්නන් සඳහා සමාන ලෙස වට්ටම් ලබා දීම මගින් නියමිත පරිදි වරිපනම් ගෙවන්නන් හට සෘණාත්මක බලපෑමක් සිදුවීමට ඉඩ තිබුණි.

(iii) රු.500,000 ට වැඩි හිඟ වරිපනම් බදු දේපල අතරින් රජයේ දේපළ 203 ක මුළු හිඟ වරිපනම් බදු මුදල රු. 378,624,282 ක් විය. මෙය රු.500,000 ට වැඩි හිඟ බදු දේපල ප්‍රමාණයෙන් සියයට 27 ක් වන අතර මුළු හිඟ වරිපනම් බදු ආදායමෙන් සියයට 13 කි.

(iv) රු.500,000 ට වැඩි හිඟ ශේෂයන් පවතින දේපළ අතරින් 2017 වර්ෂය තුලදී කිසිදු වරිපනම් මුදලක් නොගෙවූ දේපළ 527 ක් නිරීක්ෂණය වූ අතර එහි මුළු හිඟ මුදල් ප්‍රමාණය රු.994,669,418 ක් විය.

(v) සභාව තුල දැනට පවත්නා තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පද්ධතිය (AS400) තුළ තක්සේරුකරණය සම්බන්ධව විෂය ක්ෂේත්‍රය අන්තර්ගත වී තිබුණද එම ක්ෂේත්‍රය යාවත්කාලීන කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(ආ) වෙළඳ බදු හා ව්‍යාපාර බදු**

(i) 2017 වසරේ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපාර හා වෙළෙඳ බදු වශයෙන් මුදල් පදනම මත රු.31,072,020 ක් පෙන්වා තිබූ අතර එහි පෙර වර්ෂය වෙනුවෙන් ලැබූ ආදායම් වැඩි ප්‍රමාණයක් ඇතුලත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර හා වෙළඳ බදු වශයෙන් රු.66,500,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර එයින් වර්ෂය තුල අයවී තිබුණේ රු12,348,000 ක් පමණි.ඒ අනුව ගිණුමෙහි පෙන්වා තිබූ රු.31,072,020 කින් රු.18,516,000 ක් 2017 වර්ෂයට අදාල නොවූ අතර වර්ෂයට අදාල මුළු ආදායමෙන් අවසාන ගිණුම තුලින් පිළිබිඹු වුයේ සියයට 18 ක ප්‍රමාණයක් පමණි.

(ii) බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 1996 ඔක්තෝබර් 01 දිනැති අංක 39/96 දරන චක්‍රලේඛය මගින් වර්ෂයට අදාල බදු මුදල් එම වර්ෂය තුලදීම එකතු කර ගැනීමට එවායේ පරිපාලන ප්‍රධානින් කටයුතු කළයුතු බව දක්වා තිබුණත් කොළඹ මහා නගර සභාව විසින් ව්‍යාපාර බදු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

**(ඇ) විනෝද බදු**

කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුල 2017 වර්ෂය තුලදී පැවැත්වූ ප්‍රසංග, සංගීත සංදර්ශන හා ක්‍රීඩා තරඟ සඳහා අයකල විනෝද බදු මුදල රු.96,449,794 ක්වූ අතර බස්නාහිර පලාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත රු.27,552,146 ක විනෝද බදු නිදහස් කර තිබුණි. නිදහස් කල බදු මුදල ප්‍රතිශතයක් ලෙස සියයට 29 ක් විය.

**2.3.3 කුලී**

**-----**

**<u>නිවාස කුලී</u>**

කොළඹ මහා නගර සභාව සතුව නිවාස සංකීර්ණ 18 ක පවතින නිවාස 840 ක් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම නිවාසවල පදිංචිකරුවන්ගේ පොදු පහසුකම් සැපයීම, නිවාස අළුත්වැඩියා කිරීම, පදිංචිකරුවන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම හා වර්ෂ 05 කට වරක් නිවාස තක්සේරුකර ප්‍රමාණවත් කුලියක් අයකිරීම වැනි කාර්යයන් සභාව විසින් ඉටු කර නොතිබුණි.

(ii) ඉහළ වෙළඳපළ වටිනාකමක් සහිත කොළඹ නගර සීමාවේ පිහිටි මෙම නිවාස වලින් ඉතා අවම මාසික කුලියක් අයකර තිබුණි.

(iii) 2013 ජුලි 16 දිනැති මුදල් කමිටු තීරණය මගින් මෙම නිවාස නව තක්සේරුවක් කර තිබුණද එහිදි නිවාස කුලි වැඩිකර තිබුණේ රු.5, 10 වැනි ඉතා අවම අගයකිනි.

(iv) නිවාස සංකීර්ණ වලින් සභාවට අයවිය යුතු හිග කුලිය 2017 අගෝස්තු 31 දිනට රු. 3,892,599 ක් විය. මෙම නිවාස සංකීර්ණවල සැලකිය යුතු නිවාස ප්‍රමාණයක දීර්ඝ කාලයක සිට කුලී අය නොවී තිබු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. මෙම හිගහිට ඇති නිවාස ප්‍රමාණයෙන් අඩකට වැඩි නිවාස ප්‍රමාණයක වර්ෂ 10 ඉක්මවා මාසික කුලි මුදල් හිගහිට තිබුණි.

**2.4 අධිභාර**

**--------**

මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව විගණකාධිපති විසින් ඉකුත් වර්ෂයන්හි නිකුත් කර තිබු අධිභාර සහතික 03 ක් වෙනුවෙන් 2018 ජුනි 11 දිනට රු.259,988.38 ක් අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්යසාධනය**

**---------------**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

**(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>**

මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වන නමුත් කර්මාන්ත, අපද්‍රව්‍ය විධිමත් කිරීම හා පාලනය සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවන් පනවා නොතිබුණි.

**(ආ) <u>ක්‍රියාකාරි සැලැස්ම</u>**

සියළුම දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි

**(ඇ) <u>අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම</u>**

කොළඹ 12 පැරඩයිස් පෙදෙසේ ලොන්ඩ්‍රිවත්ත නූතන පහසුකම් සහිත මහල් නිවාස ව්‍යාපෘතියේ වැඩ නිම කර වර්ෂ 02 ක් ගතවී තිබුණද නිවාස ලාභීන් වෙත මෙම නිවාස ලබාදීමට ක්‍රියාකර නොතිබුණි.

**(ඈ)** **<u>කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්</u>**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්හි ඉදිකිරීම් කර්මාන්ත 81 ක් ආරම්භ කර ඒ සඳහා රු.2,390,035,187 ක් වැය කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි.

**(ඉ)** **<u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

(i) ඝණ අපද්‍රව්‍ය පවිත්‍රතා අංශය සඳහා හදිසි අවශ්‍යතාවය යටතේ ටිපර් රථ 06 ක් කුලී පදනම මත ලබාගෙන 2015 ජුනි සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා රු.94,612,168 ක මුදලක් ගෙවා තිබුණි. මෙම සේවාව ලබා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේ දුර්වලතාවයන් පිළිබඳ 2016 වර්ෂයේ විගණන වාර්තාව හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව මගින් පෙන්වා දී තිබුණද දිගින් දිගටම සේවාව ලබා ගනිමින් ගෙවීම් සිදුකර තිබුණි.

(ii) බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ රීති 06 හි දැක්වෙන පරිදි එකතු කරන ලද නාගරික ඝණ අපද්‍රව්‍ය සම්පත් ලෙස භාවිතා කළ යුතු ආකාරය දක්වා තිබුණද සභාව විසින් ඒ අනුව කටයුතු නොකර තම ප්‍රදේශයේ එකතු වන කසළ වෙනත් පළාත් පාලන බල ප්‍රදේශයකට බැහැර කිරීම සඳහා ගෙවීම් සිදු කර තිබුණි. ඒ අනුව 2017 වර්ෂය තුළදී කසළ මෙට්‍රික් ටොන් 146,717.49 ක් බැහැර කිරීම සඳහා රු.292,792,603 ක වියදමක් දරා තිබුණි. මෙසේ බැහැර කරනු ලබන කසළවලට කරන ගෙවීම්වලට අමතරව කසළ බැහැර කිරීම වෙනුවෙන් පහත පරිදි වියදම් දරා තිබුණි.

| | | රු. |
|---|---|---|
| පස් දැමීම සඳහා | | 76,532,171 |
| බුල්ඩෝසර් සඳහා (තැලීම සඳහා) | 41,738,967 | |
| කෙළවරපිටිය කසළ අංගනයට ප්‍රවේශවීමේ මාර්ගය වැඩි දියුණු කිරීමේ වියදම් | <u>1,438,550</u> | |
| | | **<u>119,709,688</u>** |

(iii) මහා නගර සභාව විසින් කසළ එකතු කිරීම, ප්‍රවාහනය, ප්‍රතිචක්‍රීකරණය සහ බැහැර කිරීම යන කාර්යයන් ඉටු කරනු ලැබුවද 2008 පෙබරවාරි 21 දිනැති අංක 1534/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නියෝග ප්‍රකාරව පරිසර ආරක්ෂණ බල පත්‍රයක් ලබාගෙන නොතිබුණි.

**(ඊ)** **<u>පාරිසරික ගැටළු</u>**

(i) විශාල පරිසර හානියක් සිදුකරන විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කොළඹ මහා නගර සභාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) කොළඹ මහා නගර සභාව විසින් 2009 වර්ෂයේ අප්‍රේල් දක්වා සභා බල ප්‍රදේශයේ කසළ, බ්ලූමැන්ඩල් ප්‍රදේශයට බැහැර කළ අතර “බ්ලූමැන්ඩල් කුණු කන්ද” ලෙස කසළ කන්දක් නිර්මාණය විය. කසළ දැමීම පිළිබඳව මහජන උද්ඝෝෂණ දිගින් දිගටම මතු වීම හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුව මත බ්ලූමැන්ඩල් කුණු කන්දට කසළ බැහැර කිරීම තහනම් කර තිබුණි. ඉන්පසු 2009 අප්‍රේල් මාසයේ සිට මීතොටමුල්ල පොතුවිල්කුඹුර ප්‍රදේශයෙහි අක්කර 02 ක භූමි භාගයකට වසර 02 ක කාල සීමාවක් සඳහා කසළ බැහැර කිරීමට අවසර ලබා දී තිබුණි. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ඉක්මවා වසර 08 කාලයක් දක්වා කසළ බැහැර කිරීම හේතුවෙන් අක්කර 23 ප්‍රදේශයක් දක්වා කසළ කන්ද ව්‍යාප්තවී 2017 අප්‍රෙල් 14 දින නාය යාමකට ලක්ව තිබූ අතර එම ව්‍යසනයෙන් මරණ 32 ක් ඇතුළුව දේපළ විශාල ප්‍රමාණයකට හානිවීම් සිදුව තිබුණි. මීතොටමුල්ල කසළ කන්ද 2018 ජනවාරි මස අවස්ථා 02 කදී ගිනි ගැනීමකට ද ලක්ව තිබුණි.

(iii) කසළ ජනනය අඩු කිරීම, කසළ නැවත භාවිතයට ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රතිචක්‍රීකරණය සඳහා විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙලක් පිළිබඳව ප්‍රමාණවත් පරිදි අවධානය යොමු නොකර

වාර්තමානයේදී ද සහා ප්‍රදේශයෙහි කසළ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් භූමියකට බැහැර කිරීම සිදු කරමින් තිබුණි.

**(ඪ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

කොළඹ මහා නගර සභාව තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව දැනුවත් වී නොමැති අතර 2018 ජුලි 31 දින වන විටත් තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන නොතිබුණි.

**(ඬ)** **ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරි සැලැස්ම තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 04 ක් සඳහා රු.127,000,000 ක් වෙන් කර තිබුණද එයින් වැය කර තිබුණේ රු.13,075,904 ක් හෙවත් සියයට 10.3 කි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

### 3.2.1 අනවසර ඉදිකිරීම්

කොළඹ මහා නගර සීමාව තුල යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව ගොඩනැගිලි සැලසුම් අනුමත ඉදිකිරීම් සිදුකල යුතු වුවත් 2017 වර්ෂයේදී අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලි 209 ක් ලැබී තිබුණි. ඉන් 111 ක් සම්පූර්ණයෙන්ම අනවසර ඉදිකිරීම් සහ 90 ක් අර්ධ අනවසර ඉදිකිරීම් සඳහා විය. මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධයෙන් පමණක් නගර සභාව ක්‍රියාත්මක වී තිබුණි.

### 3.2.2 සැලසුම් අනුමත කිරීම

(i) 2017 වර්ෂය තුල අනුකූලතා සහතික ලබා ගැනීමට ඉදිරිපත් වූ අයදුම් පත් 209 ක් අතරින් 82 කට එනම් සියයට 44 ක් සඳහාම අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණු අතර එම අනවසර ඉදිකිරීම් සඳහා සභාව විසින් නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ii) නො.04, වාර්ලිමන්ට් පාර, කොළඹ 06 ස්ථානයේ මහල් 08 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සභාව අනුමැතිය ලබා දී තිබුණු අතර ඉදිකෙරෙමින් පැවති එම ගොඩනැගිල්ල 2017 මැයි 18 දින කඩා වැටී තිබුණි. ඉදිකිරීම් අනුමත කිරීමට ප්‍රථම රක්ෂණ ආවරණ සහතිකය ඉදිරිපත් නොකිරීම පිළිබඳ අදාල නීතිමය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

### 3.2.3 කර්මාන්ත අංශය

දිසා කාර්යාල අංක 03 කර්මාන්ත අංශය මඟින් නිල නිවාසයේ ඉඩ පහසුකම් වැඩි කිරීමේ කාර්ය සඳහා එහි අවශ්‍යතාවය, සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම සඳහා වූ අනුමැතිය හා විධිමත්ව පිළියෙල කරන ලද සැලැස්මක් නොමැතිව රු.2,713,581 ක ඇස්තමේන්තු පිළියෙල කර තිබූ අතර මෙම ඇස්තමේන්තුව අනුමත කිරීමට මාස 03 කට පෙර මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. තවද ඇස්තමේන්තුවේ නොමැති කාර්යයන් සඳහාද ද්‍රව්‍ය නිකුත් කිරීම් කර තිබුණි.

### 3.2.4 GO GREEN COLOMBO - වැඩසටහන

සභාවේ නගර සැලසුම් අංශය මඟින් 2018 ජනවාරි 13 දින "GO GREEN COLOMBO" නමින් වැඩමුළුවක් පවත්වනු ලබන බවට ජාතික පුවත්පතක දැන්වීමක් පළකර තිබූ අතර එම දැන්වීම සඳහා කොළඹ මහා නගර සභාවේ සංකේතය භාවිතා කර තිබුණි. මෙම වැඩමුළුව පෞද්ගලික අංශයක් මඟින් සංවිධානය කර තිබූ අතර කොළඹ මහා නගර සභාවේ නිළ ලාංඡනය එම වැඩමුළුව සඳහා මුද්‍රණය කළ ආරාධනා පත්‍රය, සමරු කලාපය හා පුවත්පත් දැන්වීම්වලට යොදා ගැනීම තුලින් මහජනයා තුළ නගර සභාව කෙරෙහි ගොඩනැගී ඇති කීර්තිනාමයට හානි දායක තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබුණි.

**3.2.5** <u>තොග ඌනතාවය</u>

සුදුවැල්ල ප්‍රධාන ගබඩාවේ 2011 වර්ෂයේ සිදුවූ රු.2,102,784 ක් වූ තොග ඌනතාවයට වගකිව යුතු එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු තොග ඌනතාවය අතහැර දැමීමට මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව ගෙන තිබූ තීරණයට බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබී නොතිබුණි.

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**(අ)** සභාවේ අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යේෂ්ඨ | 356 | 234 | 122 | - |
| තෘතික | 190 | 118 | 72 | - |
| ද්විතික | 2871 | 1719 | 1152 | - |
| ප්‍රාථමික | 5373 | 3911 | 1462 | - |
| වෙනත් | - | 462 | - | 462 |
| එකතුව | **8790** | **6444** | **2808** | **462** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) අනුමත කාර්ය මණ්ඩලයෙහි ආරක්ෂක පරිපාලක තනතුරක් නොතිබුණද ආරක්ෂක පරිපාලකයින් 06 දෙනෙක් බඳවාගෙන තිබුණි.

(ii) ස්ථාන 29 ක් සඳහා බඳවාගත් ආරක්ෂක නියාමකයින් සංඛ්‍යාව 111 දෙනෙක් වුවත් 115 දෙනෙක් සේවයේ නිරත වී සිටි බැවින් ආරක්ෂක නියාමකයින් නොවන 04 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(iii) ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 776 ක් වුවද දැනට සිටින තත්‍ය සේවක සංඛ්‍යාව 437 ක් වීමෙන් පුරප්පාඩු 339 ක් විය.

(iii) ආරක්ෂක සේවයේ අතිකාල ගෙවීම සඳහා අතිකාල පැය ගණනය කිරීමේදී පැමිනීමේ හා පිටවීමේ ලේඛන හෝ ඇඟිලි සළකුණු සටහන් සමඟ සැසඳූ බවට සහතික ලබාගෙන නොතිබුණි.

**(ආ)** නගර ශාලා ආරක්ෂක සේවය සඳහා ආරක්ෂක පරිපාලකයින් 06 දෙනෙකු සහ ආරක්ෂක නියාමකයින් 28 දෙනෙක් යොදවා තිබුණි. ආරක්ෂක පරිපාලකයින් සහ නියාමකයින් සේවයට වාර්තා කිරීම සඳහා ලේඛන 02 ක් භාවිතා කර තිබුණු අතර එම ලේඛන පරීක්ෂා කිරීමේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) නිවාඩු ලබාගත් අයගේ නම් ලියා නොතිබුණි.
(ii) අධීක්ෂණ නිලධාරියෙකු විසින් අධීක්ෂණය කල බවට තහවුරු නොවිය.
(iii) ආරක්ෂක පරිපාලකයින් නිවාඩු ලබා සිටි දින සඳහාද අතිකාල ගෙවා තිබුණි.

**(ඇ)** ඉඩම් අංශයේ නිලධාරි හිඟයට පිළියමක් වශයෙන් ඉඩම් අංශයේ සිට විශ්‍රාම ගිය නිලධාරියෙකු උපදේශකවරයෙක් වශයෙන් 2011 ජුලි මාසයේදී පත්කරගෙන මාසිකව රු.100,000 ක දීමනාවක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අනුමත කාර්ය මණ්ඩලයට උපදේශක තනතුරක් ඇතුලත්ව නොතිබුණි.

(ii) උපදේශකවරයෙකුට නියමිත කාර්යභාරය ලිඛිත ගිවිසුමක් මගින් පවරා නොතිබුණි.

(iii) ඉඩම් නිලධාරි තනතුර දරමින් සිටියදී විශ්‍රාම ගොස් තිබු මෙම නිලධාරියා දැනට පුරප්පාඩු පවතින ඉඩම් නිලධාරි තනතුරුවල රාජකාරිවලින් යම් ප්‍රමාණයක් ආවරණය කරමින් තිබුණි.

(ඈ) නගර සැලසුම් අංශයේ අනුමත තනතුරු 140 න් 97 ක්ම පුරප්පාඩුවී තිබූ අතර තාක්ෂණික නිලධාරීන් (සිවිල්) 49 දෙනෙකුගේ පුරප්පාඩුද ඒ අතර විය. මෙම පුරප්පාඩු එම අංශයේ කාර්යක්ෂමතාව අඩාල කිරීමට හේතුවී තිබුණි.

(ඉ) වර්ෂ ගණනාවක සිට පැවත එන සේවකයින්ගෙන් අයවිය යුතු රු.38,068,453 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

---------------------------

### 3.4.1 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

(අ) <u>ගසේ ව්‍යුහය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය (Tree Scaner)</u>.

(i) නගරයේ ඇති අවුරුදු 100 කට වඩා පැරණි ගස්වල කඳ හා මුල්වල තත්ත්වය මැනීමට හා පරීක්ෂා කිරීමට 2015 වර්ෂයේදී රු.මිලියන 7.4 ක් වැය කර ඉඩම් හා පරිසර සංවර්ධන අංශය විසින් මිලදී ගෙන තිබූ ගසේ ව්‍යුහය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය 2018 ජුලි 13 දින වන විටත් භාවිතයෙන් තොරව විහාරමහාදේවි උද්‍යාන කාර්යාලයෙහි තබා තිබුණි. මෙම යන්ත්‍රය මගින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කර තීරණ ගැනීම සඳහා වෘත්තිය පළපුරුද්දක් ඇති නිලධාරීන් (වෘක්ෂ වෛද්‍ය - Arborists වැනි) සභාවේ නොමැති වීමෙන් නව යන්ත්‍රය මෙතෙක් භාවිතා කිරීමට නොහැකිවී තිබුණි.

(ii) කොළඹ නගරයෙහි ඇති පැරණි ගස් හඳුනා ගැනීම මෙම යන්ත්‍රය මිලදී ගැනීමේ එක් අරමුණක් වුවද ගසේ ව්‍යුහයන් පරීක්ෂා කිරීමට එම යන්ත්‍රය යොදාගෙන නොතිබුණි. ප්‍රධාන මාර්ගයට අවහිර වන පරිදි කොළඹ නගරයේ ගස් වැටී තිබූ අවස්ථා දක්නට ලැබුණ අතර මෙම යන්ත්‍රය භාවිතයට ගෙන අවදානම් සහිත ගස් හඳුනා ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ආ) <u>වැඩිහිටි නිවාස සතු වාහන</u>

(i) වැඩිහිටි නිවාසය සතු වෑන් රථ 02 ක් පිළිවෙලින් වර්ෂ 05 කට වැඩි කාලයක හා වර්ෂයක කාලයක සිට භාවිතයෙන් තොරව දිරාපත්වෙමින් පැවති බැවින් අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ii) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා තුන්වරක් පුවත්පත් දැන්වීම් පලකර දෙපාර්තමේන්තු අවශ්‍යතාවයට සුදුසු යැයි අනුමත ඇම්බියුලන්ස් රථයක් 2017 ජුනි 05 දින රු.7,464,500 කට මිලදී ගෙන තිබුණි. එසේ වුවද වෙනත් ඇම්බියුලන්ස් රථයක් වැඩිහිටි නිවාසය දැනට භාවිතා කරන බව විගණනයේදී අනාවරණය විය.

### 3.4.2 <u>සභාව සතු නිශ්චල දේපළ</u>

(අ) සභාව සතු නිශ්චල දේපළ පිළිබඳව ලේඛනයක් සභාව විසින් නඩත්තු කර නොතිබුණි.විගණනය වෙත ඉදිරිපත් කල තොරතුරු අනුව සභා දේපළ 151 දක්වා ඇති අතර එහි මුළු භූමි ප්‍රමාණය අක්කර 430 ක් විය. මෙම දේපළ පවරා ගන්නා අවස්ථාවේදී පැවති භූමි ප්‍රමාණයන් වර්තමානයේ එසේම පවතීද යන්න සනාථකර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සභාව සතු නොවුණි.

(ආ) දේපළ 13ක භූමි ප්‍රමාණය වූ අක්කර 32, රූඩ් 01, හා පර්චස් 01 ක අනවසරයෙන් පදිංචි වී ඒවායේ ඉදිකිරීම් සිදු කර තිබුණි. මෙම දේපළ පවරා ගැනීමෙන් පසු ඒවායේ පැවැත්ම සඳහා කිසිදු ආරක්ෂක විධි විධානයක් නගර සභාව විසින් ගෙන නොතිබුණි.ඉහළ වටිනාකමකින් යුතු මෙම දේපල වර්තමානයේ දී හෝ මිනුම් කටයුතු කර ආරක්ෂාව සඳහා පියවර නොගතහොත් අනවසර පදිංචිකරුවන්ගෙන් නැවත අත්පත්කර ගැනීම ගැටළු සහගත විය.

(ඇ) සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සභා දේපළ අතුරෙන් 18 ක මිනුම් කටයුතු කර නොමැතිබව හෙළිදරව් විය.

(ඈ) කොළඹ මහ නගර සභාවට අයත් මෝදර Elie House ඉඩමෙන් පර්චස් 50 ක් 1992 ජුලි මාසයේදී සැමට සරණ ආයතනයට බදු දී තිබූ අතර එම ඉඩමෙහි ඉතිරි පර්චස් 60 ක් සැමට සරණ ආයතනය විසින් තම කටයුතු සඳහා අනවසරයෙන් භවිතා කරන බව නිරීක්ෂණය විය. එහි අනවසර ඉදිකිරීම් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.4.3 <u>කල් ඉකුත් වූ තොග</u>**

කල් ඉක්ම වූ රු. 3,685,125 ක තර්මෝප්ලාස්ටික් කි.ග්‍රෑ. 22975 ක ප්‍රමාණයක් ගබඩාවල රඳවාගෙන තිබුණු අතර මෙම තොගයෙන් කි.ග්‍රෑ. 10000 ක් 2016 වර්ෂයේදී මිලදී ගන්නා අවස්ථාවේදීම කල් ඉකුත් වී තිබුණි.

**3.4.4 <u>වාහන උපයෝජනය</u>**

දිසා කාර්යාල අංක 03 හි මළනාලිකා අංශය, කසළ කළමනාකරණය අංශය හා කර්මාන්ත අංශයන්හි වාහන භාවිතය පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** පොදු 268 ආකෘතියේ දෛනික ධාවන සටහන් පවත්වා නොතිබුණු අවස්ථා වූ අතර දෛනික ධාවන සටහන් පවත්වා තිබූ අවස්ථාවලද ධාවන සටහන්වල ඇතුලත් කළ යුතු තොරතුරු විධිමත් පරිදි සටහන් කර නොතිබූ අවස්ථාවන්ද විය.

**(ආ)** බොහෝ වාහනවල මයිලෝ මීටර ක්‍රියාවිරහිත වී තිබීම නිසා 2017 වර්ෂය තුලදී මළනාලිකා අංශයේ වාහන 08 ක් සඳහා යොදවා තිබූ ඉන්ධන ලීටර් 22433 ක් සඳහා වැය කළ රු.2,103,175 ක්ද, කර්මාන්ත අංශයේ වාහන 23 ක් සඳහා හා කසළ කළමනාකරණ අංශයේ වාහන 45 සඳහා යොදවා තිබූ ඉන්ධන ලීටර් 353903 ක් සඳහා වැය කල රු.29,461,632 ක් පිළිබඳව, විධිමත් තහවුරුවක් කරගත නොහැකි විය.

**(ඇ)** මළනාලිකා අංශය විසින් විගණනය වෙත ඉදිරිපත් කර තිබූ ධාවන සටහන්වල දෛනික ඉන්ධන පරිභෝජනය සටහන් කර නොතිබූ අතර 2017 වර්ෂයේදී ඉන්ධන ගබඩාවෙන් නිකුත් කරන ලද ඉන්ධන ප්‍රමාණය සමඟ ප්‍රධාන කාර්යාලයේ මාසික ඉන්ධන නිකුත් කිරීමේ වාර්තා අතර ලීටර් 3596 ක වෙනසක් විය.

**3.5 ප්‍රසම්පාදනය**

**--------------**

**3.5.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

සභාවේ සියළුම දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.5.2 <u>සැපයීම් හා සේවා</u>**

**(අ)** නගර සභාව විසින් සතුටු උයන වෙනුවෙන් 2018 අප්‍රේල් 18 දින රු.27,237,359 ක් වැය කර ඩෝජම් කාර් 15 ක්, කැන්ගරු රයිඩර් ක්‍රීඩා යන්ත්‍රයක් හා ළමා කෝච්චියක් මිලදීගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කැන්ගරු රයිඩර් ක්‍රීඩා යන්ත්‍රය හා ළමා කෝච්චිය නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීය.

(ii) සවිකරන අවස්ථාවේදීම කැන්ගරු රයිඩර් ක්‍රීඩා යන්ත්‍රය අක්‍රියවී පැස්සුම් කර සභාව වෙත භාරදී ඇති බවට හෙළිදරව් වූ අතර එසේ තිබියදී සභාව විසින් මෙයට තත්ත්ව සහතික ලබාදී මුළු වටිනාකම අදාල සමාගමට ගෙවා තිබුණි.

(iii) කැන්ගරු රයිඩර් ක්‍රීඩා යන්ත්‍රය සවිකර භාර දීමෙන් පසු මාසයක් වැනි කෙටිකාලයක් තුල මහජන භාවිතයේදී එක් බාහුවක් සහ ආසන කිහිපයක් කැඩී අනතුරුදායක තත්ත්වයට පත් වී තිබුණි.

**(ආ)** <u>රථගාල් බදු දීම</u>

(i) රථ වාහන නවතා තැබීමේ ගාස්තු එකතු කිරීම හා කළමනාකරණය සඳහා අදියර 10 ක් යටතේ වාහන නවතා තැබීමේ ස්ථාන 12 සඳහා ආයතන 03 ක් වෙත ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී අදාල ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි සහතිකයෙහි ව්‍යාපාර ස්වභාවය යටතේ රථගාල් කළමනාකරණය දක්වා නොතිබූ ආයතනයකට ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි.

(ii) තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මිල ගනන් ඉදිරිපත් කර තිබූ එක් ආයතනයක් සභාවට හිඟ තිබීම හා තවත් ආයතනයක, ඇප බැඳුම්කරය වැරදි නමක් සහිතව ලබා දීම මත ප්‍රතික්ෂේප කර තිබුණු අතර ආයතන දෙකම එකම ඇප බැඳුම්කරය ලබා දී තිබුණි. එසේ වුවද, මෙම ආයතන විසින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම මත අසාධු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) රථගාල් කළමනාකරණය අදියර 10 යටතේ මිල ගණන් කැඳවීමේදි ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම නිසා නැවත මිල ගණන් කැඳවීම හේතුවෙන් රු.134,645 ක අතිරේක වියදමක් දැරීමට සිදුව තිබුණි.

**<u>3.5.3</u> <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

**3.5.3.1 <u>විට්ස් වයික් ක්‍රීඩාංගනයේ නවීකරණය</u>**

මුළු පිරිවැය ඇස්තමේන්තුවකින් තොරව විවෘත මිල ගණන් කැඳවා රු.මිලියන 36 ක කොන්ත්‍රාත්තුව දින 240 කින් නිම කිරීමට ICTAD 06 ට අයත් කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. සභාවේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ICTAD ආයතනයේ මගපෙන්වීම්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන් වලට පටහැනිව මෙම කොන්ත්‍රාත්තුව කරගෙන යාමට C6 ලියාපදිංචිය හිමි කොන්ත්‍රාත්කරු සුදුසු බවට වාර්තා කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව 2014 සැප්තැම්බර් 30 දින ආරම්භ කර තිබූ අතර 2017 ඔක්තෝබර් 02 දින වන විටත් වැඩ නිමවා භාරදී නොතිබුණි. කොන්ත්‍රාත් කාලය දිගින් දිගටම දිර්ඝ කිරීම හා සැලකිය යුතු අමතර වැඩ කොටස් එකතු කිරීම නිසා, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අකාර්යක්ෂමතාවය ව්‍යාපෘති සැලසුම් කිරීමේ දූර්වලතා හා අධීක්ෂණ දූර්වලතා පැවතුණි.

**3.5.3.2 <u>ක්‍රීඩා භූමි හා විනෝදාංශ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි ඉදිකිරීම.</u>**

2016 අයවැය මඟින් රු.මි.300 ක් වෙන් කර තිබුණි. ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණයන් අතර ප්‍රේක්ෂකාගාර 11 ක්, ප්‍රජා මධ්‍යස්ථාන 15 ක්, උත්සව ශාලා 06 ක් හා හේනමුල්ල ක්‍රීඩාංගනයේ තාප්පය ඉදිකිරීම ඇතුලත් කර තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 2016 වර්ෂයේ යෝජිත ඉදිකිරීම් 33 න් 20 ක් සඳහාම ටෙන්ඩර් කැඳවා නොතිබුණි. විගණනය වෙත ඉදිරිපත් කල තොරතුරු අනුව ඉදිකිරීම් 04 ක කටයුතු සිදුකරමින් පැවති අතර සැලසුම් වෙනස්වීම නිසා ආරම්භ නොකල කර්මාන්ත සංඛ්‍යාව 05 ක් විය.

**(ආ)** හේනමුල්ල ක්‍රීඩාංගනයේ තාප්පය සාදා නිම කල බවට ව්‍යාපෘති ඉංජිනේරු විසින් විගණනය වෙත වාර්තා කලත් එම කර්මාන්තය අතරමග නතර කර ඇති බව ගොනුව පරීක්ෂා කිරීමේදී, නිරීක්ෂණය විය.

**(ඇ)** කල්‍යාණි ගංගාරාම මාවත ප්‍රජා මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කොන්ත්‍රාත් කාලය කාලය දීර්ඝ කිරීමේදී ප්‍රමාදයට බලපෑ කරුණුවල සත්‍යතාවය තහවුරු කරගෙන නොතිබූ අතර ජලය හා විදුලිය විසන්ධි කර තිබුණේ නම් එම ගාස්තු ගෙවා ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ii) අදාල ගිවිසුමේ 49.1 වගන්තිය අනුව ප්‍රමාද ගාස්තුව දිනකට රු.3,750 බැගින් අයකර ගැනීමට කටයුතු කල යුතු වුවත් ප්‍රමාදයට හේතුවූ කරුණු වල සත්‍යතාවය තහවුරු කරනොගෙන ගිවිසුම් කාල සීමාව දින 59 කින් දීර්ඝ කිරීම නිසා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(iii) මෙම ව්‍යාපෘතිය අවසන් වී ඇති බව ඉංජිනේරු විසින් 2016 දෙසැම්බර් 21 දින ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දන්වා තිබුණත් ගිවිසුම් ගතවී තිබුණු ඇස්තමේන්තුව අනුව රු.මි.4.7 ක් වටිනා වැඩ විෂයයන් 152 ක් අත්හැර දමා තිබුණි.

(iv) ඉදිකිරීම් කටයුතු නිම කර ඇති බව සඳහන් කර තිබුණත් වැඩබිම් භාරදීමේ වාර්තාව හෝ නිම කිරීමේ සහතිකය ඉදිරිපත් නොකළ අතර 2018 ජනවාරි 12 වන දින දක්වාම මෙම ප්‍රජා මධ්‍යස්ථානය මහජනයා සඳහා විවෘත කර නොතිබුණි.

**(ඇ)** හේනමුල්ල ක්‍රීඩාංගනයේ තාප්පය ඉදිකිරීමේ කොන්ත්‍රාත් මුදල රු.13,782,076 ක් වූ අතර පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 ජුලි 15 දිනට මෙම කර්මාන්තය අවසන් කල යුතු වුවත් කොන්ත්‍රාත්කරු විසින් 2013 මැයි සිට ඉදිකිරීම් අතහැර දමා තිබුණි. ටෙන්ඩර් අවලංගු කිරීමට පෙර 2013 ජුලි 13 දිනට පළමු හා දෙවන බිල වශයෙන් කොන්ත්‍රාත්කරුට රු.5,084,023 ක් ගෙවා තිබුණි. ගෙවීම් කිරීමට පෙර, කල වැඩ ප්‍රමාණය හා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ඉදිකිරීම් ඉංජිනේරුවරයා හා ව්‍යාපෘති ඉංජිනේරුවරයා සහතික කර තිබුණි.

(ii) 2013 නොවැම්බර් 26 දිනැති මහා සභා තීරණ අංක 585 පරිදි කොන්ත්‍රාත්කරු කොන්දේසි උල්ලංඝණය කර ඇති බැවින් ටෙන්ඩරය අවලංගු කිරීමටත්, කාර්යසාධන බැඳුම්කරය සභාව සතු කිරීමටත්, කරන ලද වැඩ අසතුටුදායක බැවින් කිසිදු ගෙවීමක් නොකිරීමටත්, අත්තිකාරම් ගෙවා ඇත්නම් ඒවා අයකර ගැනීමටත්, මෙවැනි කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් ඉදිරියේදි කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් වැලකී සිටීමටද තීරණය කර තිබුණද රු.689,104 ක කාර්යසාධන බැදුම්කරය සභාව සතු කරගත් බව තහවුරු නොවිය.

**3.5.3.3** <u>මාර්ග තොරතුරු සංඥා ඉදිකිරීම් හා නඩත්තු කිරීම</u>

ප්‍රසම්පාදන ඇගයීමෙන් පසුව කොන්ත්‍රාත්තුව පුද්ගලික ආයතනයකට 2010 සැප්තැම්බර් 11 දින පවරා තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** තාක්ෂණික යෝජනා සඳහා පමණක් නිර්නායකයන් පිළියෙල කර ලකුණු ක්‍රමයක් මඟින් වැඩිම ලකුණු ලබාගත් ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය යෝජනාව 2010 ජුලි 28 දින පැවති මහා සභාවේදී පිළිගෙන තිබුණි. ලංසු කරුවන්ගේ මූල්‍ය යෝජනාවන් ඒ අනුව ඇගයීමකට ලක් වී නොතිබුණි.

**(ආ)** සභාව විසින් මෙම ව්‍යාපෘතිය මඟින් ලබා ගැනීමට බලාපොරොත්තුවන ආදායම් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු අතර ඒ අනුව ලංසුකරුගේ මූල්‍ය යෝජනාව ආයතනයට කොතරම් දුරට වාසිදායකද යන්න පිළිබඳව ඇගයීමකට භාජනය කර නොතිබුණි.

**(ඇ)** ලංසු කැඳවීමේ ලේඛනවල ලංසු කරුවන් වෙත උපදෙස් යටතේ, ඡේද අංක 4 හි වර්ෂ 04 ක් සඳහා මෙම කොන්ත්‍රාත්තුව ලබා දෙන බවත් බෝනස් ව්‍යාපෘතිය යටතේ වීථි නාමපුවරු 1525 ක් සෑදීම සාර්ථකව වර්ෂ 3 තුල නිමකිරීමෙන් පසුව තවත් වර්ෂ 3 ක් සඳහා කොන්ත්‍රාත්තුව දීර්ඝ කරනු ලබන බවත්, ව්‍යාපෘති 2 ම සාර්ථකව නිම කල පසු හා මුදල් නිසි පරිදි ගෙවූ පසු ව්‍යාපෘතිය උපරිම වශයෙන් අවු.8 ක කාලයක් සඳහා දීර්ඝ කරනු ලබන බවත් සඳහන් කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්

ආයතනයේ සඳහන් පිරිවිතර අනුව ව්‍යාපෘති 2 ම එකවර වර්ෂ අටක් සඳහා ක්‍රියාත්මක කිරීමට සභාව විසින් තීරණය කර තිබුණි.

**(ඇ)** අලුතින් ඉදිකරනු ලබන ගුන්ටි පුවරු 10 ක් ඉදිකිරීමට බලාපොරොත්තු වන ස්ථාන පිළිබඳ විස්තර ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු අතර ලංසු කරුවන් වෙත ඉදිරිපත් කර තිබූ ලංසු කැඳවීමේ ලේඛනයන්හි ඇමුණුම් II හි අලුතින් ඉදිකිරීමට බලාපොරොත්තු වන ගුන්ටි පුවරු ස්ථානයන් දක්වා තිබුණි. කොන්ත්‍රාත්කාර සමාගම විසින් අළුතින් ඉදිකරන ලද ගුන්ටි පුවරු 10 පිළිබඳ විස්තර 2011 අගෝස්තු 04 දින ලබා දී තිබූ අතර ඒවා ලංසු කැඳවීමේ ලේඛනයෙහි සඳහන් ස්ථාන සමඟ සැසඳීමේදී ඉදිකරන ලද ගුන්ටි පුවරු 07 ක ස්ථාන සභාව බලාපොරොත්තු වූ ස්ථාන නොවීය.

**(ඉ)** එකී සමාගම සමඟ එළඹී අංක 3737 දරන ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

**i.** ගිවිසුමේ ඡේද අංක 11 පරිදි එක් එක් ගුන්ටි පුවරුවල ප්‍රදර්ශනය කරනු ලබන වෙළඳ දැන්වීම් වල Art Work සඳහා නියෝජ්‍ය නාගරික කොමසාරිස් (ඉංජිනේරු සේවා) ලිඛිතව අනුමත කර නොතිබුණි.

**ii.** ගිවිසුමේ ඡේද අංක 23 පරිදි වෙළඳ දැන්වීම් සියල්ල සඳහා නියෝජ්‍ය නාගරික කොමසාරිස් (ඉංජිනේරු සේවා) ලිඛිතව අනුමත කර නොතිබුණි.

**iii.** ගිවිසුමේ ඡේද අංක 14 පරිදි වීථි නාම පුවරුවල වෙළඳ දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික වෙළඳ දැන්වීම් ගාස්තුවක් කොන්ත්‍රාත්කරු විසින් සභාවට ගෙවිය යුතු වුවද අයකරනු ලබන ගාස්තුවේ වටිනාකම හා අයකරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

**iv.** ගිවිසුමේ ඡේද අංක (1) හි (C) (D) (E) වගන්ති ප්‍රකාරව නියමිත දිනට නාම පුවරු නිම කරන ලද්දේ නම් අයකල ගාස්තුව පදනම් කරගෙන සභාව වෙත අයවිය යුතු මුදල රු.3,609,724 ක් විය යුතු වුවද 2013 සිට 2017 දක්වා බිම් කුලිය ලෙස සභාව අයකර තිබුණේ රු.3,066,473 ක් පමණි. ඒ අනුව ගාස්තු අඩුවෙන් අයකරගෙන ඇති බව නිරීක්ෂණය කෙරේ. තවද එම ආයතනය විසින් 2013 මැයි 07 දින නියෝජ්‍ය නාගරික කොමසාරිස් (ඉංජිනේරු සේවා) වෙත එවන ලද ලිපිය අනුව එදින වන විට වීථි නාම පුවරු 1267 ක් නියමිත දිනට නිම කර ඇති බව දන්වා තිබුණි.

**3.5.3.4 <u>කොළඹ 14, මාදම්පිටිය 350 වත්තේ උත්සව ශාලාව</u>**

(i) 2001 වර්ෂයේදී ආරම්භ කර 2007 වර්ෂයේදී නිම කල රු.5,422,854 ක පිරිවැය වූ උත්සව ශාලාවක් භාවිතයට නොගෙන කඩා ඉවත් කර තිබුණි.

(ii) ඉහත ගොඩනැගිල්ල 2015 වර්ෂයේදී කඩා ඉවත් කර එම ස්ථානයේම නැවතත් නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2015 ජනවාරි 30 දින වටිනාකම රු.42,880,634 ක් වූ කොන්ත්‍රාත්තුව පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණි. 2015 ඔක්තෝබර් 27 දින කොන්ත්‍රාත්තුව නිමකල යුතු වුවත් 2018 ජුනි 29 දින වන විට එම ආයතනය වෙත රු.21,873,945 ක් ගෙවා තිබුණි. අයකර ගත හැකි උපරිම ප්‍රමාද ගාස්තුව රු.4,288,063 ක් වූ අතර මේ වන විට අයකර ගත් ප්‍රමාද ගාස්තුව රු.3,838,628 විය. මේ අනුව තව දුරටත් අයකර ගතයුතු ප්‍රමාද ගාස්තුව රු.449,435 ක් විය. අත්තිකාරම රු.6,807,542 ක් වෙනුවෙන් වැය පත් වලින් අඩුකරගත් මුදල රු.4,718,541 ක් වූ නමුත් තවදුරටත් අයකර ගත යුතු මුදල රු.2,089,000 ක් විය. 2018 ජුනි 30 දින වන විටත් කර්මාන්තය නිම කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

**(අ) (i)** අය විෂයයන් 14 ක් සඳහා ආදායම් ඌන වෙන්කිරීමක් සිදුකර තිබූ අතර ඇස්තමේන්තු කල ආදායම් ඉක්මවා තත්‍ය ආදායම් අයකිරීමේ ප්‍රතිශතය සියයට 65.75 සිට සියයට 754,656 ක ඉහළ පරාසයක් ගෙන තිබුණි. අය විෂයයන් 13 ක් සඳහා රු.මිලියන 5,5026.8 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට කිසිදු ආදායමක් උපයානොතිබුණි.

**(ii)** අය විෂයයන් 20 ක් සඳහා ඇස්තමේන්තු කල මුළු ආදායම රු.මිලියන 377 ක් වූ අතර තත්‍ය ආදායම රු.මිලියන 95 ක් විය. ඒ අනුව අයනොවීමේ ප්‍රතිශතය සියයට 1 සිට සියයට 50 දක්වා වූ ඉහළ පරාසයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ ආධාර**

මධ්‍යම රජයෙන් විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ ලබා දීමට අපේක්ෂිත රු.මිලියන 190 කින් ලැබී තිබුණේ සියයට 47 කි. සභාව තම දීර්සකාලීන අරමුණු කෙරෙහි ලගාවීමට නිසි සැලසුමක් නොමැති වීමෙන් මෙසේ ප්‍රාග්ධන වැය සඳහා ලබාගත හැකිව තිබූ මෙම ආධාර ප්‍රමාණවත් පරිදි ලබාගත නොහැකි වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.2 පිළිතුරු නොලත් විගණන විමසුම්**

2017 වර්ෂයේදි නිකුත් කල පිළිතුරු නොලත් විගණන විමසුම් 14 ක ගණනය කල හැකිව තිබූ වටිනාකම රු.167,521,046 ක් විය.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර නාගරික කොමසාරිස්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | | නිසි පරිදි ලේඛන පවත්වා නොගැනීම. |
| (ආ) ආදායම් පාලනය | i. | හිඟ ආදායම් නිවැරදිව එකතු නොකිරීම. |
| | ii. | දේපළ තක්සේරු කිරීම නිසි කලට සිදු නොකිරීම. |
| (ඇ) ගබඩා පාලනය | i. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හා සියළුම ගබඩා සමීක්ෂණයට ලක් නොවීම. |
| | ii. | සමීක්ෂණ මණ්ඩල තීරණ පරිදි කටයුතු නොකිරීම. |
| | iii. | නිෂ්කාර්ය වත්කම් පිළිබඳව නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඈ) අයවැය පාලනය | | තාත්වික හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම. |
| (ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත්ව කසළ බැහැර කිරීම් හා කසළ ප්‍රතිචක්‍රීකරණය හා පාරිසරික ගැටළු පිළිබඳව නිසි අවධානය යොමු නොකිරීම. |